# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2467/75 – 2025 දෙසැම්බර් මස 19 වැනි සිකුරාදා – 2025.12.19**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

**රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

සංශෝධන අංක 01

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2013 ජූනි මස 13 වන දින අනුමත කරන ලද 2014 අගෝස්තු මස 15 වන දිනැති හා අංක 1875/39 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද රාජ්‍ය සේවයේ මෝටර් රථ රියදුරන් සඳහා ඒකාබද්ධ රියදුරු සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එන්.යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය.

2025 දෙසැම්බර් මස 19 වැනි දින.

**6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 6839**

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III, II, I හා විශේෂ ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ.

**7.2.2.1 අධ්‍යාපන සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව සඳහා සාමාර්ථයක් සමගින් සම්මාන දෙකක් සහිතව විෂයන් හයක් සමත් වී තිබීම.

**7.2.2.2 වෘත්තීය සුදුසුකම්**

(1) මෝටර් කාර් සහ ද්විත්ව කාර්යය වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ පැරණි රියදුරු බලපත්‍ර පංතිය අනුව අවම වශයෙන් සී සහ සී 1 වාහන පංතියේ වලංගු රියදුරු බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රයට අනුව බඳවා ගන්නා දිනට වසර 03 කට පෙර ලබාගත් අවම වශයෙන් බී පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් ලබා සිටිය යුතුයි.

**7.2.2.3 පළපුරුද්ද :**

වාහන රියදුරකු වශයෙන් රියදුරු බලපත්‍රය ලබා ගත් දිනෙන් පසු වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය.)

**7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය:**

I. ලිඛිත විභාගයක්, වෘත්තීය පරීක්ෂණයක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් මඟින්,
II. ලිඛිත විභාගයේ දී ලබාගන්නා ලකුණු වෘත්තීය පරීක්ෂණයට එකතු කරනු නොලැබේ.
III. පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

**7.2.4.1 ලිඛිත විභාගය**

I. විභාග කොමසාරිස් ජනරාල් හෝ පත්වීම් බලධරයා විසින් නම් කරනු ලබන ආයතනයක් මගින් ලිඛිත විභාගය පවත්වනු ලබයි.
II. *ලිඛිත විභාගය* - අභියෝගතා පරීක්ෂණය හා පොදු ප්‍රශ්න පත්‍රය ලෙස ප්‍රශ්න පත්‍ර 02කි.
III. *අභියෝගතා පරීක්ෂණය* - පැය 01 ක කාලයක් තුළ පිළිතුරු සැපයීමට හැකි වන පරිදි බහුවරණ ප්‍රශ්න 50න් යුතු ප්‍රශ්න පත්‍රයක් ලබා දෙන අතර, ප්‍රශ්න පත්‍රය සඳහා වන මුළු ලකුණු 100න් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් හෝ 40ට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු වේ.
IV. *පොදු ප්‍රශ්න පත්‍රය* - සාමාන්‍ය දැනීම, මාර්ග නීති, මාර්ග සංඥා සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත පැය 01ක ප්‍රශ්න පත්‍රයක් ලබා දෙන අතර ප්‍රශ්න පත්‍රය සඳහා වන මුළු ලකුණු 100 න් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් හෝ 40ට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු වේ.
V. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වීම සඳහා ඉහත ප්‍රශ්න පත්‍ර 2න් එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් හෝ 40ට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත යුතු වේ.
VI. පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව දිස්ත්‍රික් ජනගහන අනුපාත පදනම මත ලිඛිත විභාගයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් වෘත්තීය පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.

**7.2.4.2 වෘත්තීය පරීක්ෂණය**

(මේ යටතේ දැනට ඇතුළත් කර ඇති වගුව ඉවත් කරනු ලැබේ.)

I. වෘත්තීය පරීක්ෂණය සඳහා ලකුණු 20 ක් ලබා දෙන අතර ඉන් සමත් වීම සඳහා අවම වශයෙන් ලකුණු 10 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගත යුතු වේ.

II. මෙහිදී මහාමාර්ග නීති පිළිබඳ දැනුම සහ මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම ප්‍රායෝගිකව භාවිතය ද ඇතුළත්ව රිය පැදවීමේ නිපුණත්වය පරීක්ෂා කරනු ලබයි.

**7.2.4.2.1 වෘත්තීය පරීක්ෂණය පවත්වන බලධරයා**

වෘත්තීය පරීක්ෂණ මණ්ඩලයෙහි සංයුතිය පහත පරිදි වන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබයි.

වෘත්තීය පරීක්ෂණය පහත සඳහන් නිලධාරීන්ගෙන් සමන්විත තිදෙනෙකුට නොඅඩු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් පැවැත්විය යුතු වේ.

(I) අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක විධායක මට්ටමේ නිලධාරියෙකු එක් නියෝජිතයක් ලෙස

(II) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකයෙකු

(III) පොලිස් රථවාහන අංශයේ නිලධාරියෙකු.

**7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා**

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

**13. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය**

II. ඒකාබද්ධ රියදුරු සේවයේ II "අ" පන්තියට උසස් වීමට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

EOG 12-0187

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.